ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී දූෂණය හෝ කෙලෙසීම හෝ වැනසීම වැනි වදන් යොදා නොගන්නා ලෙසට අපි නිරන්තරයෙන්ම මාධ්‍යවේදීන්ව දිරිමත් කරමු. එම යෙදුම් ඔස්සේ විශේෂයෙන්ම වින්දිතයන්ට අත්විදීමට සිදුවිය හැකි සමාජ ගර්හාවන් හා කොන් කිරීමේ ආකල්පයන් ඊට එක් හේතුවකි.
දූෂණය හෝ කෙලෙසීම යන යෙදුම් ඔස්සේ වින්දිතයෙකු අපවිත්‍ර වී ඇතැයි ගම්‍ය වේ. ඒ ඔස්සේ වින්දිතයින් සම්බන්ධයෙන් සමාජ ගර්හාවක් සහ කොන් කිරීමක ආකල්පයක් ඇති නොවන්නේදැයි අප විමසිය යුතුවේ.
එසේම වැනසීම යන යෙදුම ඔස්සේ වින්දිතයෙකුගේ ජීවිතය එතනින් එහාට අවසන් වී ඇතැයි යන සෘණාත්මක ආකල්පය ඇතිකරවයි.
එනිසා, වැනසීම, දූෂණය හෝ කෙලෙසීම වැනි යෙදුමක් වෙනුවට වඩාත් යෝග්‍ය වන්නේ ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය වැනි යෙදුම් වේ.
#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima #Lankadeepa